<u>පෙල පොත භාවිතා කොට අසා ඇති සියලුම ප්‍රශ්න වලට පිළිතුරු ලියා විෂයභාර ගුරු භවතාට යොමු කොට පිළිතුරු තහවුරු කර ගන්න.</u>

01. බුද්ධ කෝලාහලය යනු කුමක්ද?

02. සිදුහත් කුමරු උපත ලැබුවේ කොහේදී ද?

03. බෝසත් කුමරුගේ නම් තැබීමේ මංගල්‍යයට සහභාගී වූ පඩිවරු ගණන කීයද?

04. සිදුහත් කුමරුගේ සුළුමව නම් කරන්න.

05. වප් මඟුල් දින සිදුහත් කුමරු වැඩූ භාවනාව කුමක්ද?

06. සිදුහත් කුමරු උගත් ශිල්ප දෙකක් ලියන්න.

07. සුද්ධෝදන රජු විසින් සිදුහත් කුමරුට ඉදිකර දුන් මාලිඟා තුන නම් කරන්න.

08. සතර පෙර නිමිති නම් කරන්න.

09. බිම්බිසාර රජු සිදුහත් බෝසතාන් වහන්සේගෙන් කළ ඉල්ලීම කුමක්ද?

10. සුජාතා සිටුදුව දන් පුජා කරමින් කළ ප්‍රාර්ථනාව කුමක්ද?

<u>11 – 15 දක්වා හිස්තැනට සුදුසු පිළිතුර ලියන්න.</u>

11. සිදුහත් බෝසතාණෝ ආසන්න පෙර භවයෙහි ..... දෙව්ලොව දිව්‍ය පුත්‍රයෙකු වී සිටියහ.

12. ..... හා කාළුදායී යනු සිදුහත් කුමරු සමඟ එකට හැදුණු කුමරුන් දෙදෙනෙකි.

13. ගිහිගෙය හැරයාම ..... ලෙස හැඳින්වේ.

14. පන්සලට ගොස් සිදුකරන වතාවත් අවබෝධයෙන් හා ..... කළ යුතුය.

15. මෙත් වැඩීමේ අනුසස් .....න් ඇතැයි බුදු දහමේ සඳහන් වේ.

www.lkedu.lk

16 සිට 20 දක්වා ප්‍රශ්න යා කරන්න.

16. බෝසතාණන් වහන්සේ මව්කුස පිළිසිඳ ගැනීම	වෙසක් පොහෝ දා
17. සිදුහත් කුමරුගේ මව	කාලදේවල තවුසා
18. සිදුහත් කුමරුගේ ගුරුවරයා	යශෝධරා දේවිය
19. සිදුහත් කුමරු ඉපදුනේ	ඇසළ පෝය දා
20. සිදුහත් කුමරා විවාහවුයේ	මහාමයා දේවිය

11 කොටස

01. (1). පංචමහා විලෝකන නම් කරන්න.

(11). බෝසතාණන් වහන්සේගේ උපතත් සමඟ සිදුවූ අසිරිමත් සිදුවීම් තුනක් ලියන්න.

(111).පුංචි කුමරු කළ සිංහනාදය ලියන්න. (තේරුම සහිතව)

02. (1). සුද්ධෝදන රජුගේ ගුරුවරයා කවුද?

(11). "සිද්ධාර්ථ" යන්නෙහි තේරුම කුමක්ද?

(111).සිදුහත් කුමරුගේ චරිතයෙන් ගතහැකි ආදර්ශ 05ක් ලියන්න.

03. (1). නිඛ්ඛුත පද කීවේ කවුරුන්ද?

(11). නිඛ්ඛුත පද ඇතුලත් ගාථාව ලියන්න.

(111).ත්‍රිවිද්‍යාව නම් කර ඒවායෙහි තේරුම ලියන්න.

04. (1). පන්සලේදි කරන චාරිත්‍ර 02ක් ලියන්න.

(11). ත්‍රිවිධ චෛත්‍ය නම් කරන්න.

(111).ශාසනික වචන ලියන්න.

a. අතු ගානවා -

b. නිදියනවා -

c. මිදුල -

d. යනවා -

e. බුලත් -

www.ikedu.lk

05. (1). භාවනාව සඳහා අසුන් ගන්නා ක්‍රම 02ක් ලියන්න.

(11). භාවනාවේ පළමු පියවර ලියන්න.

(111).මෙත් වැඩීමේ අනිශංස 05ක් ලියන්න.

06. (1). රාහුල කුමරාට බුදුරදුන් ලබාදුන් දායාදය කුමක්ද?

(11). රාහුල හාමුදුරුවෝ වැලි දෝතක් අහසට විසිකර කළ ප්‍රාර්ථනය කුමක්ද?

(111). රාහුල හාමුදුරුවන්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ 05ක් ලියන්න.

07. (1). දියුණුවේ රන් දොරටු ඇතුලත් ජාතක කථාව කුමක්ද?

(11). දියුණුවේ රන් දොරටු නම් කරන්න.

(111). ඒවා අනුගමනය කිරීමෙන් ඔබ තුල වර්ධනය වන යහපත් ගුණාංග 05 ලියන්න.

www.lkedu.lk